# රනිල්ගේ හැකියාව

රනිල් වික්‍රමසිංහ මහතා මෙරට පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ය. එමෙන් ම එ ජා පක්ෂයේ ද නායකයා ය. අද ඒ මහතා කරන්නේ එකම එක කාර්යයකි. ඒ විදේශ රටවලට ගොස් මෙරට ආණ්ඩුව විවේචනය කිරීම ය. විශේෂයෙන් ම මෙරට මානව අයිතීන් නැතිවීම පිළිබඳ ව ලෝකයේ අවධානය යොමු කිරීම ය. පැහැර ගැනීම්, මරා දැමීම් ආදිය මෙන් ම පුවත්පත් ඇතුළු ජනමාධ්‍යයෙහි නිදහස ගැන ද ඒ මහතා විදේශවල දී කරුණු දක්වයි. ඉදහිට ලංකාවට පැමිණි අවස්ථාවක දී ඒ මහතා මානව හිමිකම් කඩවූවන්ගේ පවුල්වල සාමාජිකයන් සංවිධානය කිරීමට උත්සාහ දරයි. රනිල් වික්‍රමසිංහ මහතාට එසේ කටයුතු කිරීමෙන් ම මෙරට අඩුම තරමින් විරුද්ධ පක්ෂ නායකයාටවත් භාෂණ නිදහස තිබෙන බව ඒ මහතා ප්‍රායෝගික ව ම පෙන්නුම් කර ඇත. ආණ්ඩුව කළ යුත්තේ විදේශවල සංචාරය කර ආණ්ඩුව විවේචනය කිරීමට ඒ මහතාට ගුවන්යානයක් වෙන්කිරීම ය. දැනට ඒ මහතා විදොශ සංචාරයෙහි යෙදෙන්නේ ඒ මහතාගේ පෞද්ගලික මුදලින් නම් ඒ සියළු වියදම් ආපසු ගෙවීමට ආණ්ඩුව පියවර ගත යුතු ය. ඒ මහතා දැනට විදේශ සංචාරයෙහි යෙදෙන්නේ වෙනත් ආයතනයක හෝ සංවිධානයක හෝ සංවිධානවල හෝ මුදලින් නම් ඒ වියදම් වු මුදල් අදාළ සංවිධානවලට ගෙවීමට ආණ්ඩුව කටයුතු කළ යුතු ය.

එයට අමතරව ආණ්ඩුව ඒ මහතාගේ මානව හිමිකම් කඩවුවන්ට සම්බන්ධ සංවිධාන පවත්වාගෙන යෑමට ද ආධාර කළයුතු ය. ආණ්ඩුවට එවිට කී දෙනකුගේ මානව අයිතිවාසිකම් නැති වී ඇත් දැයි ඒ මහතාගෙන් ම දැනගත හැකිවනු ඇත. ඒ මානව අයිතිවාසිකම් නැතිවූවන් අතර ඒ ඒ පක්ෂවල සාමාජිකයන්, අනුගාමිකයන්, හිතවතුන් ආදීන් කී දෙනකු සිටින්නේ ද යන්නත් ඒ මහතා ආණ්ඩුවට ප්‍රකාශකරනු ඇත. ගුවන් යානයක් සැපයීමෙන් හා මුදල් ටිකක් වියදම් කිරීමෙන් රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඒ තොරතුරු ලබාගත හැකිව තිබිය දී ආණ්ඩුව වෙනත් මාර්ගවලින් ඒ ලබාගැනීමට කටයුතු කිරීම මනා කළමනාකාරීත්වයට පටහැණි ය.

ඒ අතර පසුගිය වකවානුවේ රනිල් වික්‍රමසිංහ මහතාට යෑමට නොහැකි වු රටවල් ඇත්නම් ඒ සොයා බලා වහාම ඒ මහතා ඒ රටවලට පිටත්කර හැරීමට ද ආණ්ඩුව කටයුතු කළ යුතු ය. මානව අයිතිවාසිකම් ගැන කතාකිරීමට සිටින වඩාත්ම සුදුස්සා රනිල් වික්‍රමසිංහ මහතා බවට සැකයක් නැත. මා එසේ කියන්නේ ඒ මහතා බටලන්ද සම්බන්ධ පරීක්ෂණයෙන් නිදහස් වු නිසා ම නො වේ. ඒ මහතා ළඟට මානව අයිතිවාසිකම් ගැන කතාකිරීමට සුදුසු ම තැනැත්තිය වු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ගැන තොරතුරක් පවා ලබාගැනීමට නොහැකිවීම එයට එක් හේතුවකි. රනිල් වික්‍රමසිංහ මහතා බටලන්ද සිද්ධි සම්බන්ධයෙන් නිදහස් වුයේ ද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය බලයේ සිටි අවධියේ ය.

වික්‍රමසිංහ මහතා බටලන්ද සම්බන්ධයෙන් වරදකරු ලෙස තීරණය වී තිබුණ ද ඒ මහතාට මානව අයිතිවාසිකම් ගැන කතාකිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය. යමකු වරදක් කළ පමණින් අනෙකකුගේ වරද කීමේ අයිතිය නැතිකළ නො හැකි ය. වික්‍රමසිංහ මහතා මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් කිසිම චෝදනාවකට වරදකරු වී නොතිබීමෙන් ඒ මහතාගේ අයිතිය මෙන් ම අගය ද තවත් වැඩිවෙයි.

එහෙත් රනිල් වික්‍රමසිංහ මහතා මේ මානව අයිතිවාසිකම් වැඩේට සුදුසුම තැනැත්තා ලෙස මා සලකන්නේ මේ කිසිවක් නිසා නොවේ. ඒ මහතා මොන වැඩය කරන්නට ගිය ද ඒ ඉතා ඉහළින් කදිමට කරයි. වික්‍රමසිංහ මහතාගේ ඒ ගුණය අප බොහෝ දෙනාට අමතක වෙයි. බටහිර මානව අයිතිවාසිකම් ගැන අප එතරම් තැකිය යුතු නො වේ. බටහිරයෝ අප ලවා ඔවුන්ගේ මානව අයිතිවාසිකම් රැක්කවීමට උත්සාහ කරති. ඔවුන්ගේ මානව අයිතිවාසිකම්වල රඟ අපි දනිමු. එහෙත් අපට ඒ ගැන මෙහි දී කතාකිරීම අවශ්‍ය නැත.

අපට අවශ්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මේ මානව අයිතිවාසිකම් වැඩේ නොව මොන වැඩේ වුවත් කදිමට කරන්නකු බව හෙළිදරවු කිරීම ය. පසුගිය දිනවල රබන් ගැසීමේ දී ද පස්දුන් කෝරළයේ ඉතිහාසය ගැන කීමේ දී ද ඒ මහතා කදිමට තම කටයුත්ත ඉටුකෙළේ ය. ආණ්ඩුව එවැන්නකුට හැකි සෑම ආධාරයක් ම දිය යුතු ය. ඒ මහතා මානව අයිතිවාසිකම් වැඩේ ද ඉතා කදිමට කරනු ඇත. ආණ්ඩුවට ඒ පිළිබඳ කිසිම සැකයක් තිබිය යුතු නො වේ. දැනටමත්

© Prof. Nalin De Silva

ඒ සම්බන්ධයෙන් ඒ මහතා කර ඇති කාර්ය සුළුපටු නො වේ. එහෙත් අපට දැනට ප්‍රශ්නයක් වෙයි. රනිල් වික්‍රමසිංහ මහතා මානව අයිතිවාසිකම් වැඩීට අත දැම්මේ තමාගේ වුවමනාවකට ද? නැත්නම් බටහිරයන්ගේ අවශ්‍යතාවට ද? ඒ මහතා තමා වෙනුවෙන් වැඩකට නොබසින පරාර්ථකාමී පුද්ගලයකු බැවින් අපේ අනුමානය නම් ඒ මහතා මානව අයිතිවාසිකම් වැඩීට අත ගසා ඇත්තේ බටහිරයන්ගේ අවශ්‍යතාවට බව ය. ලංකාව සම්බන්ධයෙන් ගත්කල බටහිරයන්ට කෝකටත් ඇත්තේ එක්කෝ රනිල් වික්‍රමසිංහ මහතා ය. නැත්නම් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ය. එහෙමත් නැත්නම් ප්‍රභාකරන් ය. ප්‍රභාකරන් රට රටවල සංචාරය කිරීමට කැමැත්තක් නොදක්වන බංකර්කාමියකු බැවින් බටහිරයෝ ජාත්‍යන්තර වැඩවල දී ඒ වෙනුවට තමිල්සෙල්වන් යොදා ගනිති.

කලින් කී දෙදෙනාම බටහිරයන්ගේ නොම්මර එකේ වැඩකරුවන් බව ප්‍රසිද්ධ රහසකි. දෙදෙනාගේම පිය පාර්ශ්වයේ ඇත්තෝ බ්‍රිතානියේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි සභාවේ සාමාජිකයෝ වූහ. දෙදෙනාම අයත්වන්නේ බටහිර නූතනත්ව ක්‍රිස්තියානි සංස්කෘතියට ය. ඔවුන් ඒ සංස්කෘතියට අයත්වන්නේ ඇතැම් ගුවන් විදුලි නාලිකාවල නාම්බන් නැම්බියන් මෙන් සිංහල වචන අතර ඉංගිරිසි වචන කිහිපයකින් දමා ගැසීමෙන් නොවේ. ඔවුහු ඒ සංස්කෘතිය මැනවින් දනිති. කුමාරතුංග මහත්මිය මේ වන විට ආගිය අතක් නොමැති බැවින් බටහිරයන්ට එකම සරණ වී ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතා ය.

සමහරවිට බ්‍රිතානි පාර්ලිමේන්තුව තමිල්සෙල්වන්ට කන්දීමෙන් පසුව රනිල් වික්‍රමසිංහ මහතාට බ්‍රිතානි මන්ත්‍රීවරුන්ට ලංකාවේ මානව අයිතිවාසිකම් නැතිවීම ගැන කතාකිරීමට ඉඩදෙනු ඇතැයි සිතිය හැකි ය. ආණ්ඩුව මේ එකක් ගැනවත් කලබල වියයුතු නො වේ. බ්‍රිතානි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කරන කතා ඒ මන්ත්‍රීවරුන්ම ලියාදීමට ඇති ඉඩකඩ බොහෝ ය. එසේත් නැත්නම් මන්ත්‍රීවරුන් අවශ්‍ය උපදෙස් දීම බලාපොරොත්තු විය හැකි ය. කවුරු කවුරුත් සාමාන්‍යයෙන් කැමති තමන් කැමති දේ ඇසීමට බැවින් මෙහි වරදක් දැකිය නො හැකි ය. ඒ කෙසේ වෙතත් සමහරවිට බ්‍රිතානීන් ඒ උපක්‍රමය ඉගෙනගන්නට ඇත්තේ ඉතා ප්‍රසිද්ධියට පත් සිංහල ලේඛකයන්ගෙන් විය හැකි ය. ඇතැම් ප්‍රසිද්ධ සිංහල ලේඛකයන් තමන්ගේ කෘති ගැන තමන් ම ලියූ විචාර අනෙක් අයගේ නමින් පළකරගත් අවස්ථා ගැන බ්‍රිතානීන් වුව ද නොදැන සිටී යැයි සිතීම අසීරු ය.

රනිල් වික්‍රමසිංහ මහතා තමාට තමිල්සෙල්වන් මහතාට පසුව බ්‍රිතානි මන්ත්‍රීන් ඇමතීමට ඉඩදීම ගැන කණගාටු නොවන බව අපි දනිමු. බ්‍රිතානි පාර්ලිමේන්තු සම්ප්‍රදායෙහි අවසාන කතාව කරන්නේ නායකයා හෝ ඔහුගේ නියෝජිතයා හෝ බව මෙරට පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂ නායකයා වූ රනිල් වික්‍රමසිංහ මහතා දනියි. හැරත් ලංකාවේ පාර්ලිමේන්තුවේ කතාකිරීමට ඒ මහතාට විදේශ සංචාර නිසා දැන් විවේකයක් නැති බැවින් පාර්ලිමේන්තු අම්මා (අම්මගෙ පාර්ලිමේන්තුව නොවේ) නමින් ප්‍රසිද්ධ වී ඇති බ්‍රිතානි පාර්ලිමේන්තුවේ කතාකිරීමට ලැබුණහොත්, කතාව කවුරු ලියුවත් වික්‍රමසිංහ මහතා බෙහෙවින් උද්දාමයට පත්වනු ඇත. ආන්ඩුව ඒ මහතාගේ අහිංසක උද්දාම අයිතියට කිසිම බාධාවක් නොකළ යුතු ය. බටහිරයන්ට අනුව උද්දාම අයිතිය ද මානව අයිතියකි.

රනිල් වික්‍රමසිංහ මහතා තකහනියක් චීනයට ගියේ ඇයි දැයි සොයා බැලිය යුතු ය. ලංකාවේ චීන තානාපතිතුමා ශ්‍රී ල නි පක්ෂයේ යෝජනාවලිය අනුමත කෙළේ නොබෝදා ය. බටහිර තානාපතිවරුන් තිස්ස විතාරණ මහතාගේ යෝජනා පසුපස යද්දී චීන තානාපතිතුමා ශ්‍රී ල නි ප යෝජනා අනුමත කිරීම බටහිරයන්ට ද රනිල් වික්‍රමසිංහ මහතාට ද තිස්ස විතාරණ මහතාට ද ප්‍රශ්නයක් විය හැකි ය. වික්‍රමසිංහ මහතා චීන ආණ්ඩුවේ මතය වුව ද වෙනස්කිරීමට සමත් අයකු විය හැකි ය. විතාරණ මහතා කියන අන්දමට නම් ඒ මහතා ඉදිරිපත්කරන්නේ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ යෝජනා ය. ලංකාවේ සියළුම දේශපාලන පක්ෂ සමසමාජ පක්ෂය විසින් නියෝජනය කෙරෙන්නේ යැයි තිස්ස විතාරණ මහතා සිතා සිටිනවා විය හැකි ය. එසේ සිතීමට ඒ මහතාට ඇති අයිතියට අප ගරුකරන බව නොවළහා කිව යුතු ය. සමහරවිට ඒ මහතා සිහිනයක් දකිනවා විය හැකි ය. අප වඩාත්ම ගරුකරන්නේ කාට කාටත් සිහින දැකීමට ඇති අයිතියට බව ද කිව යුතු ය. කෙසේ වෙතත් රනිල් වික්‍රමසිංහ මහතා පිටරට ගොස් කරන කතා ඔස්සේ මානව අයිතිය කඩවීම වැළැක්වීමට එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට එවීමට බටහිරයන් ගන්නා උත්සාහය සිහිනයක් නොවන නමුත් ඒ සිහිනයක් බවට පත්කිරීමට වික්‍රමසිංහ මහතාට ඇති හැකියාව නම් සුළුපටු නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva